

චිත්‍රය - චන්දන සෙනෙවිරත්න

# මනහර නා මෙනෙවිය සහ කැළණි විහාරේ.....!

**ම න හර නා මෙනවිය නිඳ ලවැලි පිට
ගෙන මිණි වෙණ තත් නියගින් මැද රුවට
ක න හෙව කියන බුදුගුණ ගී මියුරු කොට
සැන හෙව කැළණි ගඟබඩ මඳ කලක් සිට**

***(සැළලිහිණි සංදේශය)***

**දු**රුතු පොහෝ දා රැයේ සඳ රැසින් නැහැවෙන කැළණි ගඟා ඉවුරේ සිටින කෙනෙකුට සුදෝ සුදු පැහැයෙන් සඳ එළියේ එහා ඉවුරේ දිදුලන කැළණි මහා විහාරයේ සාංටා නාදයද, උවසු උවැසි යන්ගේ සාදු නාදය ද නිරන්තරයෙන් ඇසිය හැක. සිහිල් සුළං රැල්ල විසින් ගෙනෙනු ලබන ගං ඉවුරේ සල්, සපු, නා රුක් මතින් වැහෙන මල් සුවඳින් හා දුරුතු පුරා හඳේ සෞම්‍ය චන්ද්‍ර කාන්තියෙන් ගතෙහි දාහය නිවී යයි. දවස පුරා පීඩා දුන් කිසියම් සිතුවිලි සමුදායක් සිත්හි වීද ඒ සියල්ල ඈත දිස්වන විහාරයේ දර්ශණය හා ගැටී මැකී යමින් සිත නිවී සැනසී සුවපත් වේ.

කාලාන්තරයකට පෙර අප ලක්දිව නාග ගෝත්‍රිකයින් අතර මැණික් පුටුවක් නිසා හටගත් ආරවුලක් නිරාකරණය කිරීමට බුදුහාමුදුරුවන් කැළණියට වැඩම කළ බව කියති. එම නාගයින් අතීතයේ ලක්දිව විසූ එක් හෙළ ගෝත්‍රයක් බව කියන අතර තවත් අය කියන්නේ වෙනත් නාග ලෝකයක් ජලය යට ඇති බවයි. එහි වෙසෙන නාග මානවිකාවන් ඉතා රූමත් බවද පැරණි සාහිත්‍ය පොත පතේ සඳහන් වේ.

දුරුතු පොහෝ දිනයේ එකියන නා ලොවින් මතුව, මිනිස් ලොව කැළණි ගං ඉවුර වෙතට පැමිණෙන නාග යුවතියන් එතැන වැලි තලාවෙහි හිඳ මැණික් වීණා වාදනය කරමින් බුදු ගුණ ගී ගායනාකරනු රැයේ කැළණි ගඟ අසබඩට පැමිණි අය දැක ඇති බවට කොතෙකුත් ජනකතා ආදි කාලයේ සිට අපට අසන්නට ලැබේ.

සැළලිහිණි සංදේශ කාව්‍යය රචනා කළ තොටගමුවේ ශ්‍රීරාහුල මා හිමියෝ සිය දූතයා වූ සැළලිහිණියාට ඉහත දැක්වූ කවියෙන් කැළණි ගඟබඩ මඳක් රැඳී, නා මෙනෙවියන් ගේ ගී හඬ හා වෙණවැයුම අසා යන මෙන් ආරාධනා කර සිටිති.

ඔබ සොබා සෞන්දර්යයෙන් පිරිපුන් හදැතියෙකු නම් දුරුතු පොහෝ රැයක සඳ කැල්මෙන් බබලන කැළණි ගංඉවුර අසළට ගිය හොත් රුක් සෙවනැළි අතරින් ඒ නාග ආශ්චර්යය ඔබ ද දකිනවා නොඅනුමාන ය.

“ උපන් දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැළණියේ...”

♦ **විනෝදනී ප්‍රියා සිරිමාන්න**

දිවුලපිටිය Sri Lanka

# මාධ්‍ය නිදහස රාහු ගිලගනී!



**මරාදැමූ ලසන්ත වික්‍රමතුංග මහතා**

**ශ්‍රී** ලංකාවේ **සන්ඩේ ලීඩර්** පත්‍රයේ කර්තෘ ලසන්ත වික්‍රමතුංග මහතා ඊයේ (බ්‍රහස්පතින්දා) උදය කාලයේ කොළඹ රත්මලානට නුදුරු ජනාකීර්ණ පෙදෙසකදී නාඳුනන පුද්ගලයින් සිව් දෙනෙකු විසින් සාහසික ලෙස ඝාතනය කරනු ලැබීම ඉමහත් කණගාටුවක් මෙන්ම ශ්‍රීලංකා පුවත්පත් මාධ්‍යයට කණකොකා හැඬීමක්ද වෙයි. බොහෝ දෙන තවමත් විපිලිසරව මේ කුමක් වූයේ දැයි විමසිල්මත්ව සිටිති. විශේෂයෙන් සන්ඩේ ලීඩර් වැනි රටේ ප්‍රධාන පුවත් පතක කතුවරයා එලෙස ඝාතනය කරනු ලබාවියයි කිසිකෙනෙකු නොසිතුවා නිසැකය. ශ්‍රීලංකාවේ මාධ්‍ය නිදහසට ඉමහත් අඳුරු දසාවක් ලබා ඇති බව හා සිවිල් ජනජීවිත කෙරෙහි එල්ල වී ඇති තර්ජනය කොපමණදැයි අපට මෙම ඝාතනය පැහැදිලිව පෙනේ.

ලසන්තගේ පත්‍රකලාව දෙස නොයෙක් ආකාරයෙන් බලන අය සිටිති. කෙනෙකුට ඔහු දූෂණ, වංචා හෙළිකරන දක්ෂ මාධ්‍යවේදියෙකි. බොහෝ දේශපාලකයින්ට නම් ඔහු අනවශ්‍ය කුණුගොඩවල් එළියට අදින කෙනෙකි. තවත් අයට ඔහු විමර්ශන ශීලී පත්‍රකලාව ප්‍රගුණ කළ මාධ්‍යවේදියෙකි. මේ කුමන ආකාරයක හැඩරුවක් ඔහුට තිබුණත් ඒ සියළුම දෑ පත්‍රකලාවේ සාධනීය ලක්ෂණ ලෙස බටහිර ලෝකයේද පිළිගෙන ඇත. එබැවින් පත්‍ර කලාවේදියා ඒ කුමන මගක් අනුගමනය කළද ඔහු මරාදැමිය යුතු තරමේ වරදකාරයෙකු නොවේ.

ලසන්ත පසුගිය කාලය පුරාම ලීඩර් පත්‍රයෙන් ශ්‍රීලංකාවේ දේශපාලන ක්ෂෙත්‍රයේ අක්‍රමිකතා සහ දූෂණ හෙළිකිරීම කරගෙන ගියේය. ඔහු එක් අතකට බලයේ සිටින අයට විශාල හිසරුදාවක් වූවාසේම ඒ හෙළිකළ කරුණු නිසා ජනතාව එතෙක් සැඟවී තිබුණු රහස් අවබෝධකර ගත්තෝය. මාධ්‍යවේදියා බොහෝවිට ජනතා කෝණයෙන් බලන්නෙකි. විමර්ශණශීලී පත්‍රකලාවේදියා සමාජ ශෝධකයෙකුද වේ. ලසන්තගේ ලීඩර් පත්‍රය බලයේ සිටින සෑම රජයකම වැරදි ඇවිස්සූ හැටි අප දැක ඇත. විශේෂයෙන් ඔහු චන්ද්‍රිකා මැඩම්ගේ පාලනය දැඩි විවේචනයට ලක් කළ අතර, ඇය එකල ඔහු හා අමනාපයෙන් පසුවූ බව බොහෝ අය දැන සිටි කරුණකි. විවාදයට තුඩු දෙන රාජ්‍ය ගනුදෙනු ලීඩර් පත්‍රයෙන් අනාවරණය කෙරිණ. ලසන්තට මරණීය තර්ජණ මීට අවුරුදු ගණනකට පෙරද එල්ලවීය. ඔහු අවුරුදු කීපයකට පෙර දිනක් උදෑසන ගෙදර එළියේ රැවුල කපමින් සිටියදී නාඳුනන තුවක්කුකරුවෙකු ඔහුට වෙඩි තැබීය. වහා මුවාවී ලසන්ත අනූනමයෙන් බේරුණේය. ඒ තැබූ වෙඩි පහරවල් ඔහුගේ නිවසේ බිත්තිය පුරාම වීය.

1990 පෙබරවාරි 18 වන දින අලුයම රිචර්ඩ් ද සොයිසා නම් මාධ්‍ය වේදියා සහ නළුවා පැහැරගෙන ගොස් මරාදැමීම එදා විශාල ආන්දෝලනයකට තුඩු දුන්නේය. පත්‍රකලාවේදීන් දඩයම් කිරීම සැබැවින්ම ඇරඹුණේ එදා සිට ය. එහෙත් එහි වරදකරුවන් කිසිවෙකු මේ දක්වා අල්ලා ගත්තේ නැත. ලංකාවේ සිදුවන බොහෝ අපරාධවලට දැන් කලක සිට වරදකරුවන් අල්ලාගැන්මක් සිදු නොවේ. ලංකාවේ අපරාධ දිනෙන් දින ඉහළ යන්නේ එනිසයි.

ලසන්ත ඝාතනයට දැන් ඇඟිල්ල දිගුවී ඇත්තේ රජය දෙසටය. විශේෂයෙන් විපක්ෂය, රාජපක්ෂ රජයට දොස් කියති. ලසන්තගේ ඝාතනය රජය අපකීර්තියට පත්කිරීමට කොටි ත්‍රස්තවාදීන් කරන්නට ඇතියි සමහරුන්ගේ මතයයි. කෙසේ හෝ වැරදිකරුවන් අල්ලන ලෙස ජනාධිපතිතුමා නියෝග කොට ඇත.

මෙසේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම ජාත්‍යන්තර වශයෙන්ද සුභ පණිවුඩයක් නොවේ. එය ලංකාවේ ශ්‍රී නාමයේ දැලි ගෑවීමකි. ලංකාවට මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය සම්බන්ධයෙන් ද සමහරු චෝදනා නගති. මෙවැනි දේ ගැන ලංකා රජය දැඩි ලෙස සැලකිලිමත් විය යුතුය.

මාධ්‍යවේදියෙකු මරා දැමීමෙන් ඔහුගේ හඬ නිහඬ කරන්නට කිසිවෙකු සිතයි නම් ඒ ඉතා වැරදි කල්පනාවකි. මාධ්‍යවේදීන් නොසිටින්න ජනසමාජයක් කෙසේ නම් නිවරද වේද? ඒ ජනසමාජය නියෝජනය කරන රජය නිවරද වේද? ලසන්ත වික්‍රමතුංග මහතාගේ අභාවය අප සමාජයට වූ දැඩි පාඩුවකි.

♦ ***දයා ආනන්ද රණසිංහ***





